www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චිකාගෝ කම්හල වාඩිලාගැනීමේ පාඩම්

## Lessons of the Chicago factory occupation

**2008 දෙසැම්බර් 12**

රිපබ්ලික් වින්ඩෝස් ඇන්ඩ් ඩෝර්ස් සමාගමේ කම්කරුවන් 250ක් සිය ප්‍රධාන ඉල්ලීම් ලබා දෙන ගිවිසුමක් දිනාගැනීමෙන් පසුව, ඉලිනොයි ප්‍රාන්තයේ චිකාගෝහි පිහිටි සිය කම්හලෙහි දින පහක් තිස්සේ පැවති වාඩිලාගැනීම පසුගිය බදාදා අවසන් කලහ.

රිපබ්ලික් කම්කරුවන් ගත් ක්‍රියාමාර්ගය දැවැන්ත ඉදිරි පියවරක් වන අතර, එය වනාහි දිගහැරෙන ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වසයෙන් එක්සත් ජනපදයේ කම්කරු පන්තියේ කොටසක් ගත් ප්‍රථම ස්වාධීන ක්‍රියාමාර්ගයයි. තමන්ට නීතිමය වසයෙන් ලැබිය යුතු ප්‍රතිලාභ ලැබෙන තෙක් තමන් කම්හලෙන් ඉවත් නොවන බව අවධාරනය කරමින්, කම්කරුවෝ ධෛර්‍යයෙන් හා අධිෂ්ඨානයෙන් යුක්තව ක්‍රියාත්මක වූහ.

මෙම කම්කරුවන්ගේ අරගලය, රට පුරා -- සත්තකින් ම ලොව වටා -- ලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය කම්කරුවන්ට සිය රැකියා දිගට ම අහිමි වන තතු යටතේ බැංකුවලට හා මූල්‍ය ආයතනවලට ඩොලර් ට්‍රිලියන ගනන් දොල පිදේනි දී ඇති ආන්ඩුවේ පිලිවෙත්වලට ද දැවැන්ත දොට්ට දැමීම්වලට ද එරෙහිව ගැඹුරු වන වෛරයේ හා ප්‍රතිරෝධයේ සලකුනක් බවට ඉක්මනින් ම පත් විය. ඔවුන්ගේ ක්‍රියාමාර්ගය රට පුරා සියලු ප්‍රදේශවලින් පුලුල් සහයෝගයක් ජනිත කලේය.

කම්කරුවෝ සිය අරගලයේ ජයග්‍රහනය ප්‍රකාශ කරමින් බදාදා රාත්‍රියේ කම්හලෙන් පිටතට පාගමනින් ගියහ. එක් එක් කම්කරුවාට, සේවය අවසන් කිරීමේ දී ලබා දෙන සති අටක වැටුප, උපයා ගත් නිවාඩු දීමනා සහ මාස දෙකක සුව සේවා ආවරන දීමනා ඇතුලුව, ඩොලර් 6,000ක් පමන ලැබෙනු ඇත.

කම්කරුවන්ගේ ක්ෂනික ඉල්ලීම්වල ආස්ථානයෙන් ගත් කල ජයග්‍රහනයක් වන නමුත්, එය තිත්ත-මිහිරි එකකි. ශිෂ්ඨ සම්පන්න රැකියා සොයා ගත නොහැකි කොන්දේසි යටතේ රිපබ්ලික් කම්කරුවන්ට සිය රැකියා අහිමි වනු ඇත. මාස දෙකකට පසුව ඔවුන්ට සුව සේවා ආවරනයක් නැත. ඇමරිකානු හා ලෝක ආර්ථිකය මහා අවපාතයෙන් පසුව පැවති දරුනුම ආර්ථික කඩාවැටීමට ඇතුලු වෙමින් සිටින අතර රිපබ්ලික් කම්කරුවෝ, රැකියා සුරක්ෂිත භාවයක් හා ආරක්ෂන වැඩපිලිවෙලක් නොමැතිව මෙම අර්බුදයට මුහුන දෙනු ඇති රට පුරා සිටින මිලියන සංඛ්‍යාත කම්කරුවන්ට එක් වනු ඇත.

අරගලයේ සීමිත ස්වභාවය -- එය කම්හල ම වසාදැමීමට විවෘතව ම විරුද්ධ නොවුනි යන කාරනාව -- සම්බන්ධයෙන් වගකිව යුත්තේ කම්කරුවන් නොව එක්සත් විදුලි කම්කරු සංගමයේ (යූඊ) නායකත්වයයි. සමිති නිලධරය කම්හල වසාදැමීමට කිසිසේත් ම අභියෝග නොකල අතර ආරම්භයේ පටන් ම ඔවුන්ට උත්සාහ කලේ කම්කරුවන්ගේ ප්‍රතිරෝධය ඩිමොක්‍රැටික් පක්ෂය පිටුපසින් යොමු කිරීමටයි.

එකඟතාවයේ වියදම පියවා ගනු පිනිස, රිපබ්ලික් සමාගමේ ප්‍රධාන නයහිමියා වන බැංක් ඔෆ් ඇමරිකා ඩොලර් මිලියන 1.35ක් ලබාදීමට එකඟ වූ අතර සමාගමේ සියයට 40ක් අයිති ජේපී මෝර්ගන් චේස් ආයතනය අමතර ඩොලර් 400,000ක් ලබා දුන්නේය.

එක්සත් ජනපදයේ විශාලතම බැංකුවලින් දෙකක් වන බැංක් ඔෆ් ඇමරිකා සහ ජේපී මෝර්ගන් යන ආයතන දෙකට ඔක්තෝබරයේ සම්මත කෙරුනු බැංකුවලට ඇප දී ගලවා ගැනීමේ ඩොලර් බිලියන 700 වැඩපිලිවෙල යටතේ ඩොලර් බිලියන 25ක් ලැබුනි. බැංක් ඔෆ් ඇමරිකා සඳහා, මෙය වනාහි, ඉහල විධායක නිලධාරින්ට ගෙවන වාර්ෂික වන්දි මුදල්වලින් හුදු සුලු කොටසකට සමාන මුදලක් වන, රිපබ්ලික් කම්කරුවන් සඳහා වෙන් කිරීමට එය එකඟ වී ඇති ප්‍රමානය මෙන් 20,000ක පමන ගුනයකි.

"රැකියා ආරක්ෂා කිරීමේ" අවශ්‍ය පියවරක් ලෙස තල්ලු කෙරුනු, ඇප දීමේ වැඩපිලිවෙලින් ලැබුනු මුදල් බැංකු විසින් යොදා ගනු ලැබ ඇත්තේ, නය දීම ඉහල දැමීම පිනිස නොව, සිය ශේෂ පත්‍රවල හිඟ පියවා ගැනීම සහ දේපොල පවරා ගැනීම සඳහා ය. ඇත්ත වසයෙන් ම, බදු ගෙවන්නන්ගේ මුදල්වලින් ආන්ඩුව වෙතින් දොල පිදේනි ලැබුනාට පසුව ඔවුන් ස්වකීය සේවකයන් දහස් ගනනක් දොට්ට දැමීම නිවේදනය කර තිබේ. රිපබ්ලික් කම්කරුවන් එය සඳහන් කල පරිදි: "ඒගොල්ලන්ට ඇප ලැබුනා. අපව විකුනා දැම්මා."

වෝල් වීදියට ඇප දී ගලවා ගැනීමේ සිය ඩොලර් ට්‍රිලියන ගනනක වැඩපිලිවෙලෙහි විවෘත පන්ති ස්වභාවය පිලිබඳව නැගෙන මහජන වෛරය පිලිබඳව හොඳින් දන්නා ඇමරිකානු සංගත හා දේශපාලන ප්‍රභූව රිපබ්ලික් වාඩිලාගැනීම මගින් මවිතයට හා භීතියට පත් කෙරුනි. එපමනක් නොව, සිය කම්හල වාඩිලාගැනීම මගින්, කම්කරුවෝ ධනපති පාලනයේ

පදනමට් නිෂ්පාදන මාධ්‍යයන්ගේ පුද්ගලික අයිතියට නිසැක අභියෝගයක් එල්ල කලහ. පාලක පන්තිය හුරු පුරුදුව ඇත්තේ බැරෑරුම් අභියෝගයකින් තොරව සිය ඉල්ලීම් ඉදිරියට තල්ලු කිරීමටයි. තමන්ට නීතිමය වසයෙන් හිමි විය යුතු ප්‍රතිලාභ දිනාගනු පිනිස කම්කරුවන්ට කම්හලක් වාඩිලාගැනීමට සිදුව ඇත කරුන ම, එක්සත් ජනපදයේ පන්ති සබඳතාවන්ගේ තත්වය පිලිබඳ දර්ශකයකි.

චිකාගෝහි පිහිටි සාපේක්ෂව කුඩා කම්හලක කිහිප සියයක් කම්කරුවන් ගත් මූලිකත්වය වඩා දැවැන්ත යමක් දල්වාලීමේ තර්ජනය මතු කලේය. ජනාධිපති ලෙස තේරී පත් වූ බරක් ඔබාමා ඇතුලු ඩිමොක්‍රැටික් පක්ෂ දේශපාලනඥයන් ගනනාවකගේ වාචික සහයෝගය කම්කරුවන්ට ලැබීමෙන් පසුව ඇති කර ගැනුනු ඉක්මන් සම්මුතිය පිලිබිඹු කලේ, මොන යම් හෝ වඩා පුලුල් අරගලයක් වලකා ගැනීමේ, එය පාලනය කර ගත නොහැකි තත්වයට පත් වීමට පෙර පාලනය කර ගැනීමේ ප්‍රයත්නයකි.

රිපබ්ලික් කම්කරුවන්ගේ අධිෂ්ඨානය, ප්‍රතිරෝධය දැක්වීමක් පිලිබඳ මවාපෑමකින් පවා තොරව මහා මෝටර් රථ සමාගම් තුනෙහි නව දැවැන්ත සහන මාලාවකට එකග වී ඇති එක්සත් මෝටර් රථ කම්කරු සංගමයේ බංකොලොත්කමට පැහැදිලිව ම ප්‍රතිකූලව පිහිටයි.

සිය ක්‍රියාවේ දී රිපබ්ලික් කම්කරුවන් පෙන්නුම් කර ඇත්තේ, කම්කරු පන්තික ප්‍රතිරෝධයේ වඩා විවෘත රූපාකාරයන් නොමැත්තේ, කම්කරුවන් අතර අධිෂ්ඨානයේ අඩුවක් නිසා නොවන බවයි. දශක තුනකට ආසන්න කාලයක් තිස්සේ, සමිති කම්කරු පන්තියේ මොන යම් හෝ ස්වාධීන අරගලයක් ක්ෂමා විරහිත ලෙස මැඩ තිබේ. එවන් අරගල පිපුරුන කල සමිති නායකත්වය ඒවා ක්‍රමානුකූලව හුදකලා කොට පාවා දී ඇත.

රිපබ්ලික්හි අරගලය, ලොව වටා පන්ති අරගලයේ නැගිටීමක ආරම්භක සංඥාවකි. එය වනාහි ධනපති ක්‍රමයේ ම ප්‍රතිවිරෝධතා හා අර්බුදය තුලින් නොවැලැක්විය හැකි ලෙස ම පැන නැගුන අරගලයකි. එය 1930 ගනන්වල දැවැන්ත වාඩිලාගැනීමේ වර්ජන ඇතුලු දශක ගනනාවක් අතීතයට දිවෙන ඇමරිකානු කම්කරු පන්තියේ සටන්කාමී සම්ප්‍රදායන් ස්පර්ශ කරයි.

එක්සත් ජනපදය තුල හා ලොව වටා මිලියන ගනන් මුහුන දෙන මූලික ප්‍රශ්නය නම් දේශපාලන ඉදිරිදර්ශන පිලිබඳ ප්‍රශ්නයයි. ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වසයෙන් කම්කරුවන් මතු කරන ඉල්ලීම්, ඔවුන් විරැකියා පෝලිමට ගාල් කරන සේවය අවසන් කිරීමේ ගෙවීම් සඳහා කෙරෙන සටනකට සීමා කල නොහැකි ය. ඔවුහු කම්හල් වසා දැමීමට, දොට්ට දැමීම්වලට, වැටුප් කප්පාදුවලට හා අර්බුදයේ බර කම්කරු පන්තිය මත හෙලීමේ සියලු ප්‍රයත්නයන්ට සෘජුවම අභියෝග කල යුතු ය, විරුද්ධ විය යුතු ය. ඔවුහු සිය සටන, සියල්ලන් ම සඳහා රැකියා හා ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි සඳහා වන ගෝලීය අරගලයක් ඇතුලත් කර ගැනීම දක්වා පුලුල් කල යුතු ය.

එවන් අරගලයක් ක්ෂනිකව මතු කරන ප්‍රශ්නය නම්, නිෂ්පාදන බලවේග පාලනය කරන්නේ කවුරුන් ද හා ඒවා සංවිධානය කෙරෙන්නේ කුමන මූලධර්ම මත ද යන්නයි. රිපබ්ලික් වාඩිලාගැනීම නිසැකව ම මතු කල අභියෝගය, ධනපති පුද්ගලික දේපොලවලට මතු කල අභියෝගය, නව දේශපාලන ඉදිරිදර්ශනයක පදනම මත දැනුවත්ව භාර ගත යුතු ය.

අවසානයේ, රිපබ්ලික් කම්කරුවන් දොට්ට දමනු ලැබුවේ, ඔවුන්ගේ ශ්‍රමය සූරාකෑම තව දුරටත් ලාභදායක නොවූ නිසා ය, ලෝකයේ ධන සම්පත්වලින් අති මහත් බහුතරය පාලනය කරන ජනගහනයේ තුනී ස්ථරයේ අවශ්‍යතාවන්ට එය තව දුරටත් සේවය නොකල නිසා ය. මිලියන ගනන් ජනයා වඩා වඩා දැවැන්ත දුෂ්කර කොන්දේසිවලට මුහුන දෙන තතු යටතේ පවා, සමාජයේ අවශ්‍යතා සැපයීමට අවශ්‍ය නිෂ්පාදන බලවේග කපා දැමේ, නැත හොත් වසා දැමේ. මූලික නිෂ්පාදන බලවේග සහ දැවැන්ත මූල්‍ය ආයතන, තව දුරටත් තනි පුද්ගලයන් අත තැබිය නොහැකිය, ඒවා පුද්ගලික ලාභය සඳහා පාලනය කෙරෙන තත්වයේ තැබිය නොහැකි ය.

ඒවා වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර පාලනය යටතේ, පොදු ආයතන බවට ජනසතු හා පරිවර්තනය කල යුතු ය. මෙය ඉල්ලා සිටින්නේ, මහා ව්‍යාපාරික පක්ෂ දෙකෙන් ම බිඳීමක් සහ කම්කරු ආන්ඩුවකට සටන් වදිනු පිනිස කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය තහවුරු කර ගැනීමකි.

රිපබ්ලික් කම්කරුවන්ගේ අරගලය, මූලික හා සීමිත ආකාරයකින් පමනක් වුවත්, කම්කරු පන්තියේ සමාජ බලය ප්‍රදර්ශනය කර ඇති අතර, වෛෂයික අර්බුදය කම්කරු පන්තිය අරගලයට තල්ලු කොට සමාජවාදී විඥානයේ වර්ධනය සඳහා කොන්දේසි නිර්මානය කරනු ඇත යන සංකල්පය සනාථ කර තිබේ. තීරනාත්මක ප්‍රශ්නය නම්, කම්කරු පන්තියේ නව නායකත්වය ලෙස සමාජවාදී සමානතා පක්ෂය ගොඩනැගීමයි.

**ජෝ කිෂෝර්**

© www.wsws.org